*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) උපවගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 08 දිනැති අංක 2018/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.06.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) උපවගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 19 දිනැති අංක 2019/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.06.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017.06.20 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2017 පෙබරවාරි 16 දිනැති අංක 2006/42 දරන අති විශේෂ ගැසට් පත්‍රය)
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2017 අගෝස්තු මස 08 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

65/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවල ආරක්ෂක උපදේශක තනතුර සඳහා නිලධාරීන් පත් කිරීමේදී සලකා බලන සුදුසුකම් කවරේද;

(ii) ආරක්ෂක උපදේශක තනතුරෙහි කාර්යභාරයන් කවරේද;

(iii) ඔවුන්ගේ සේවා කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවල සේවය කරන ආරක්ෂක උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් එම තනතුරු සඳහා පත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන මහතා තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක වශයෙන් පත් කරන ලද දිනය කවරේද;

(ii) වැඩ තහනමට ලක් වූ නිලධාරියෙකුට මෙවැනි තනතුරක් දැරීමට නීතිමය ප්‍රතිපාදන තිබේද;

(vi) එම එකඟතාවය පරිදි කටයුතු නොකිරීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වී ඇති පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1611/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, වලව කලාපයට අයත් ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉන් ජනතාව සඳහා බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය, එක් එක් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අක්කර 50ට වැඩි ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ඉඩම් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(iv) ඉහත (iii) හි සඳහන් ඉඩම් කැබිනට් අනුමතියක් මත ලබා දුන්නේද;

(v) නොඑසේ නම්, එම ඉඩම් ලබා දුන් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1626/'17

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තඹුත්තේගම රෝහල, උතුරු මැද පළාත් සභාවට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මූලික රෝහල්වලින් එක් රෝහලක් බව දන්නේද;

(ii) එසේ නම්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ තඹුත්තේගම, ගල්නෑව රාජාංගනය, තලාව, ඉපලෝගම සහ නොච්චියාගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සහ වයඹ පළාතේ මහව, ගල්ගමුව සහ මීගලෑව යන ප්‍රදේශවල රෝගීන් මෙම රෝහලෙන් ප්‍රතිකාර ලබා ගන්නා බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම රෝහලේ පළමු වාට්ටුවේ/හදිසි අනතුරු වාට්ටුවේ සාමාන්‍යයෙන් දිනකට නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම වාට්ටුවේ ඇති ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(iii) රෝගීන් සඳහා ලබාදී ඇති පහසුකම් පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(iv) මෙම රෝහල සඳහා පසුගිය වර්ෂයේ නව වාට්ටු සංකීර්ණයක් ඉදිකර ඇති බව දන්නේද;

(v) මේ වනතෙක් එහි වැඩ අවසන් නොකිරීමට හේතුව කවරේද;

(vi) නව ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසන් කර එය විවෘත කිරීමට මැදිහත් වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

(viii) මධ්‍යම පරිසර අධිකාරි පනත ප්‍රකාරව, දී ඇති උපදෙස් නොසලකා හැර ඇති ආයතන කොපමණ සංඛ්‍යාවකට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1593/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා වයඹ පළාත් සභාව මඟින් අළුතින් ආරම්භ කළ පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1606/'17

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විදුලි පද්ධතිය සුහුරු පද්ධතියක් (Smart Grid) බවට පත්කිරීමට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(ii) ශ්‍රී ලංකාවේ විදුලි පද්ධතිය සුහුරු පද්ධතියක් බවට පත්කිරීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ විදුලි පද්ධතිය විදුලි නිෂ්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සුහුරු පද්ධතිය මඟින් සිදු කිරීම සඳහා වැය වන ආයෝජනය කොපමණද;

(iv) එම කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන වර්ෂය කවරේද;

(v) එම කාර්යය ඉටු කිරීම සඳහා මූල්‍ය ආධාර ලබාදෙන රාජ්‍ය සහ ජාත්‍යන්තර ආයතන කවරේද;

(vi) එකී අරමුණ ඉටු කරගැනීම සඳහා මෙතෙක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබාදී ඇති අරමුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1612/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි කලාපවල දීර්ඝ කාලයක් පදිංචි වී සිටින ජනතාවගේ ඉඩම් සඳහා හිමිකම්පත් ලබාදීමේ ක්‍රමවේදය කවරේද;

(ii) ඒ යටතේ වලව කලාපයේ ඇතැම් ඉඩම් සඳහා තක්සේරු කර ඇති මුදල අසාධාරණ බව පිළිගන්නේද;

(iii) මේ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති පියවර කවරේද;

(iv) වසර ගණනාවක් පදිංචිව සිටින ජනතාවගෙන් ඉඩම් සඳහා සාධාරණ බදු මුදලක් අයකර හිමිකම් ලබාදීමට ගත වන කාලය කොපමණද;

(v) ඒ සඳහා ක්‍රියාකරන ආයතනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

